# ධර්මාධිපත්‍යය වපුරන උඳුවප් මාසය

අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ ජීවමාන බුද්ධ ශක්තියේ ධර්මාධිපත්‍යය පතුරමින් ජීවමානව වැඩ සිටින සිරිමා බෝ සමිඳුන් ලක්දිවට වැඩම කරන ලද්දේ උඳුවප් මාසයකයි. ඒ ශ්‍රී මහා බෝධීන් වහන්සේ විසින් උරා ගන්නා ලද නිකෙලෙස් කුළුඳුල් බුද්ධ ශක්තිය නොහොත් ධර්මාධිපත්‍යය විකිරණ ශක්ති තරංග මගින් විසිරුවා සිරිලක්දිව පුරා සද්ධර්ම බලය වැපිරීමේ ශාසනික කාර්‍යය ආරම්භ වූ උඳුවප් මාසය **උඳුවප්** නමින් හැඳින්වීම ඉතා අර්ථාන්විතයි.

උඳුවප් යන්නෙහි සරල තේරුම උඳු වපුරන මාසය යන්නයි. ඒත් භාෂා පරිණාම න්‍යාය අනුව රික් යන්න රුක් වන්නා සේ, රිපු යන්න රුපු වන්නා සේ, සංස්කෘත ඉන්ද්‍රගෝපක යන්න උඳුගොවු වන්නා සේ, අධිපතිබව කියන ඉඳු යන්න උඳු වී ඉන්ද්‍ර භාවය නමැති ඉඳුබව නොහොත් ආධිපත්‍යය වපුරන යන අරුතින් උඳුවප් මාසය යන්න හැඳෙන්න පුළුවන් වෙනව.

අප ජීවත්වන විශ්වයට අයත් සියළුම දේ ත්‍රිමූර්තිය, යොහෝවා, දෙවියන් වහන්සේ, හෝ අල්ලා යනුවෙන් ජීවමාන ආත්මයක් ලෙස මූර්තිමත් කොට ඇති ස්වභාව ධර්මයේ ආධිපත්‍යයට යටත්වෙනව. බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා පවා ස්වභාව ධර්මයට යටත්. උන්වහන්සේලා වියපත්ව, ජරාජීර්ණව, ලෙඩ රෝග වලට ගොදුරු වී අවසන් සුසුම හෙලන්නේ ස්වභාව ධර්මයට යටත්වයි. මේ අනුව විශ්වයේ අධිපතියා ස්වභාව ධර්මයයි. ඒ ධර්මයට අනුරූපීවීම සද්ධර්මයයි. පටහැනිවීම අසද්ධර්මයයි.

සිරිමා බෝ සමිඳු දුමිඳු යනුවෙන් හැඳින්වෙන්නෙ ශ්‍රී සද්ධර්මයේ ධර්මාධිපත්‍යය පතුරවමින් වෘක්ෂයන් අතර අධිපති වෘක්ෂය බවට පත්වී තිබෙන නිසයි. එසේ සිරිමා බෝ සමිඳු වෘක්ෂයන් අතර අධිපතිබවට පත්වූයේ බුදුන්වහන්සේ බුද්ධත්වයෙන් පසු සත් සතියක් බෝ සමිඳුන් ඇසුරේම වැඩවසමින් ඒ බෝධිවෘක්ෂයට බුද්ධ ශක්තිය කැවූ නිසයි. අද ඒ මුල් බෝසමිඳුන් නැතත් අනුරාධපුර මහමෙව්නා උයනේ ජීවමානව වැඩ සිටින්නේ ඒ මුල් බෝ සමිඳුන්ගේ දක්ෂිණ ශාඛාවයි.

ශ්‍රී දළදා වහන්සේ ඇතුළු සර්වඥධාතූන් වහන්සේලාත්, ශ්‍රී මහා බෝධීන් වහන්සේත් අතර ඇති ප්‍රධාන වෙනස නම් බුදුන්වහන්සේගේ මෘත ශරීරයේ අස්ථිපඤ්ජරයෙන් සැදුණු ධාතූන් වහන්සේලා ස්වභාව ධර්මයට අනුව දිරාපත් වෙමින් පවතින අතර, ශ්‍රී මහා බෝධීන් වහන්සේ නිරන්තරවම පණ පෙවෙමින් සප්‍රාණික ලෙස වැඩ සිටීමයි. ඒ නිසා අදත් මුළු විශ්වය පුරාම පැතිරී පවතින සද්ධර්මාධි පත්‍යයේ ජීවමාන මූලාශ්‍රය ශ්‍රී මහාබෝධීන් වහන්සේයි. ජීවමාන බුද්ධ ශක්තිය අපට දැනෙන් නේ ඒ ශ්‍රී මහාබෝධීන් වහන්සේගෙන් විකිරණය වන ශක්ති තරංග මගිනුයි.



අනුරාධපුරයේ ශ්‍රීමහා බෝධින්වහන්සේ

මාරයා අසද්ධර්මයේ ආධිපත්‍යය පතුරා ජීවමානව වැජඹුනත් සද්ධර්මයේ ආධිපත්‍යය දරමින් අද ජීව මානව වැඩසිටින්නේ ශ්‍රී මහා බෝධීන් වහන්සේයි. උන් වහන්සේ වැඩසිටින්නේ විශ්ව සාධාරණ අනිත්‍ය දුක්ඛ අනාත්ම තාව දෘශ්‍යගෝචර වනසේ අවුරුදු පතා ප්‍රදර්ශනය කරමිනුයි.

මුළු බෝධීන් වහන්සේම අවුරුද්දේ එක් කාලයකදී රන්වන් බෝපත්වලින් සැරසී අලංකාරවත්ව සිටියත් තවත් කාලයකදී එම අලංකාරය ජරා ජීර්ණව කොළ වැටෙන බෝධීන් වහන්සේ ඉපලක් ලෙස දර්ශනය වන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්මතා ධර්මයේ ආධිපත්‍යය අපට පැහැදිල කරමිනුයි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ හැම බීජාංකුරය කින්ම මිහිමත වපුරන්නේ ශ්‍රී සද්ධර්ම යේ ආධිපත්‍යයයි.

ඉඳුබව යනු අධිපති බවයි. එහි එන සඥක දු යන්ෙන් ඇති උ කාරයේ බලපෑමෙන් ඉයන්න උයන්න වෙලයි ධර්මාධිපත්‍යය වපුරන ඉඳුවප් යන්න උඳුවප් වන්නේ. මේ මාසයේදී ලක්දිව පුරා පන්සල්වල පැවැත්වෙන සංඝමිත්තා පෙරහැරවල් බෝධි ධර්මාධිපත්‍යය වැපිරීමට රුකුලක් වෙනව.

♦ **මහාචාර්‍ය - නීතිඥ ටී. එස්. අබේවික්‍රම**
**Harrow UK**

## The Sacred Jaya Siri Maha Bodhi in Anuradhapura

Unduvap Poya is the last full-moon day of the year. It is a very important and historic day for Sri Lanka, as it was on this Poya day that Princess Sangamitta Theri arrived in Dambakolapatuna port in Jaffna with a right branch of the Sri Maha Bodhi in India accompanied by a retinue of several others. King Devanampiyatissa received the Bo sapling and the visitors with utmost respect.

The most revered site in Anuradhapura is this Sri Maha Bodhi, because it is from a cutting of the original bodhi tree in Bodhgaya, India, under which Prince Sidhartha attained enlightenment - the Buddhahood. This bodhi tree is the oldest documented tree in the world with a chronicled history stretching back over 2,000 years.

It was one of favorite sites in Anuradhapura because of the bustling activity of devotees and priests. Although a busy place of worship, the **Sri Maha Bodhi** retains a sense of tranquility and peacefulness that makes it so special to the Buddhist world.


Duke's Court Travel
DUKE'S COURT TRAVEL Travel Management
Fly to Colombo
SriLankan Airlines fr £345 + Taxes
Qatar Airways fr £325 + Taxes
Kuwait Airways fr £200 + Taxes
Emirates fr £545 + Taxes
Etihad Airways fr £314 + Taxes
Oman Air fr £165 + Taxes
Note: All fares mentioned are low season / terms & conditions apply.
020 8748 3535
ATOL 3045 AITO IATA
204 King Street, London W6 0RA


## 'Praying' dog at Japanese temple
## ජපන් විහාරයේ භාවනානුයෝගී සුනඛයා

Attendance at a Buddhist temple in Japan has increased since the temple's pet, a two-year-old dog, has joined in the daily prayers.

Conan, a Chihuahua, sits on his hind legs, raises his paws and puts them together at the tip of his nose.

" He may be showing his thanks for treats and walks," says a priest at Jigenin temple on Okinawa island.

Priest, ven. Joei Yoshikuni would like Conan to meditate, but " it's not like we can make him cross his legs", he says.

"Basically, I am just trying to get him to sit still while I meditate," he told Associated Press news agency.

Ven. Yoshikuni said it only took Conan a few days to imitate the motions of praying.

" I think he saw me doing it all the time and got the idea to do it too," he said.

Jigenin temple now gets 30% more visitors than it did before Conan joined in the prayers, priest Yoshikuni said.



ජපානයේ බෞද්ධ විහාරයකට එන බැතිමතුන්ගේ සංඛ්‍යාව ඉතා සීඝ්‍රයෙන් වැඩිවූයේ ඒ පන්සලේ සිටින සුරතල් බල්ලෙකු භාවනා වැඩසටහනට එකතු වූ පසුව ය. කොනාන් නමැති මේ සුනඛයාට පස්සා ගාත් දෙකෙන් හිටගෙන, ඉදිරිපස ගාත් උස්සා නමස්කාර කරගෙන දීර්ඝ වෙලාවක් ඉන්නට පුළුවන. පන්සලේ ලොකු හාමුදුරුවන් සමග එකට භාවනාවේ යෙදෙන කොනාන් ට එය හුරුවී ඇත්තේ හැමදාම වාගේ තමා දිහා බලා සිටීමෙන් විය හැකියයි ඒ විහාරයේ නායක හිමියෝ පවසති.


මේ උත්සව සමයේ ඔබගේ නැදෑ හිතමිතුරන්ට
පහසුව, සුරක්ෂිතව මුදල් යැවීම සඳහා එකම විශ්වාසවන්ත නාමය
10th Anniversary FAST CASH 1999-2009
FAST CASH SEND TODAY - COLLECT TODAY
* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය
Transfer Fees From only £5
හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරි, අසිරිමත් නත්තලක් සහ සුබ නව වසරක් වේවා!
COMMERCIAL BANK BOC BANK OF CEYLON HNB HSBC සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK Standard Chartered
020 8886 4488 www.efastcash.biz
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT
Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි